"නඩු තීන්දුවෙන් දුමින්දට අසාධාරණයක් වුණාද?" යන සිරස්තලයෙන් යුතුව පසුගියදා ඉරිදා මව්බිම (10/04) පුවත්පතේ පළව තිබූ ලිපියකි. මෙහිදී යම් යම් කරුණු ඉදිරිපත් කරමින්, දුමින්ද සිල්වා සම්බන්ධයෙන් ලබාදුන් නඩු තීන්දුව ගැටළු සහගත යැයි තීරණය කොට තිබිණි. එම කරුණු තුළට රන්ජන් රාමනායක සහ තවත් පාර්ශවයන් කිහිපයක් අතර ඇතිවූයේ යැයි පැවසෙන දුරකථන සංවාදයන්හි අන්තර්ගතයන්ද ඇතුළත් විණි.

කෙසේ වෙතත් මෙහිදී පැවසිය යුතු වන්නේ, රන්ජන් රාමනායක හා අනෙකුත් පාර්ශවයන් අතර ඇතිවූයේ යැයි පැවසෙන දුරකථන සංවාදයන්ට අදාළ හඬ පට සම්බන්ධ විමර්ශණ තවමත් පැවැත්වෙමින් ඇති බවයි (ඒ බව මෙම ලිපිය තුළද සඳහන්ව ඇත). එසේ නම් මෙම ලිපිය සම්බන්ධයෙන් පැන නැගෙනා ගැටළු මෙසේ ඉදිරිපත් කළ හැක.

1) මෙම දුරකථන සංවාදයන් පිළිබඳව තවමත් විමර්ශණ අවසන් වී නැති පසුබිමක, එම දුරකථන සංවාද නිශ්චිතව සිදුවූ බව සහ එම සංවාදයන්හි සන්දර්භය දුමින්ද සිල්වා නඩු තීන්දුවට සෘජුවම අදාළ බව පුවත්පත මගින් නිශ්චිතව නිගමනය කරන්නේ කෙසේද?

2) නඩු තීන්දුවක් හෝ අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් සලකා බැලීමට මාධ්‍යයකට හැකියාව ඇති නමුත්, එහිදී සිදුවිය යුත්තේ ඒ සඳහා පදනම් වන කරුණු ඉදිරිපත් කිරීම සහ ඒ ඔස්සේ ඒ පිළිබඳව වන සැකශංකාවන් දැක්වීමයි. එසේ නොමැතිව, එම නඩු තීන්දුව කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව, වංචනිකව ලබාගත්තක් බව සහ එම නඩු තීන්දුවට අදාළ අධිකරණ ක්‍රියාවලිය දෝෂ සහගත බව නිශ්චිතව පැවසීමේ පදනම කුමක්ද? එය නිල වශයෙන් අදාළ අධිකාරීන් ඔස්සේ තහවුරු වී තිබේද?

3) එසේ නොමැති නම්, අධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දුවන් නිවැරදි නොවේ යයි මාධ්‍යයක් මගින් නිශ්චිතයක් ලෙසින් ඉදිරිපත් කිරීම ගැටළුකාරී නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #SundyMawbima**